# වාණිජ ධාරා

## වාණිජ විෂයය ගුරු සිසු අත්වැල

**(අධ්‍යාපන කාර්යාලය – බළන්ගොඩ)**

## ACCOUNTING - 33

## නිපුණතාව 12

## සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන


**අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා**


**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ**

**සම්පත් දායකත්වය** කේ.එම්.එන්.කේ.සමරක්කොඩි


**වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය**

# 12

# සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.




කේ.එම්.එන්.කේ.සමරක්කොඩි

වාණිජවේදී උපාධි

ර/සාන්ත ඇග්නස් බාලිකා මහා විද්‍යාලය

## නිපුණතාව 12 : - සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

### නිපුණතා මට්ටම 12.1 : - සිමාසහිත සමාගමක් ආශ්‍රිතව ඇති නෛතික පසුබිම විමසා බලයි.


**ඉගෙනුම් පල :-**

- සිමාසහිත සමාගම් යන්න නිර්වචනය කරන්න.
- 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව සමාගම් වර්ග කරයි.
- සමාගම් ගිණුම්කරණය සඳහා නෛතික පසුබිමක් පවතින බව පැහැදිලි කරයි.
- සමාගමක් විසින් පවත්වා ගත යුතු වාර්තා නම් කරයි.
- සමාගමකට නිකුත් කළ හැකි කොටස් වර්ග හා ප්‍රකාශිත ප්‍රාග්ධනය පැහැදිලි කරයි.

**සමාගමක් යනු :-**

2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව ලියාපදිංචි කළ යුතු නීතිමය පුද්ගල බාවයක් සහිත ව්‍යාපාර සංවිධාන වර්ගයකි.

**2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව සමාගම් වර්ගීකරණය :-**



**ක්‍රියාකාරකම 01**

පහත සඳහන් ව්‍යාපාර සංවිධානවල වෙනස්කම් 03 ක් සඳහන් කරන්න.

| සීමාසහිත පොදු සමාගම් | සීමාසහිත පෞද්ගලික සමාගම් |
|---|---|
| 1. | 1. |
| 2. | 2. |
| 3. | 3. |

## සමාගම් ගිණුම්කරණය සඳහා නෛතික පසුබිම :-

සීමිත සමාගම් ගිණුම් පිළියෙල කිරීමේ දී පහත සඳහන් නීතිරීති හා අණපනත් අනුගමනය කළ යුතුය.

- 1995 අංක 15 දරන ගිණුම්කරණ හා විගණන පනත
- 2007 අංක 07 දරන සමාගම් පනත
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත
- කොටස් වෙළෙඳපොළ නීතිරීති

## සමාගමක් විසින් පවත්වා ගත යුතු වාර්තා :-

සීමිත සමාගමක් විසින් පහත පොත්පත් හා වාර්තා පවත්වා ගනියි.

- සමාගමක් තම මුදල් ලැබීම් හා ඒ මුදල් වියදම් කළ ආකාරය දැක්වෙන වාර්තා
- සමාගමේ වත්කම් හා බැරකම් පිළිබඳ වාර්තා
- භාණ්ඩ වෙළෙඳම හා සම්බන්ධව නම් ණයට ගැනුම් හා විකුණුම් පිළිබඳ ගනුදෙනුකරුවන්ගේ හා සැපයුම්කරුවන්ගේ වාර්තා
- අවසාන තොග වාර්‍රාතා
- සේවා සැපයීම සම්බන්ධ නම් සේවා වාර්තා

## සීමිත සමාගමක කොටස් වර්ග

සමාගම් පනතේ 49 වගන්තියට අනුව කොටසක්යනු චංචල දේපලකි.සීමිත සමාගමකට නිකුත් කළ හැකි කොටස් වර්ග කිහිපයකි.

01. සාමාන්‍ය කොටස්

02. වරණීය කොටස්

03. විශේෂිත කොටස්

**ක්‍රියාකාරකම 02**

දක්වා ඇති නිර්ණායක මත පහත කොටස් වර්ග දෙකෙහි අසමානකම් වගුවේ දක්වන්න.

| නිර්ණායක | සාමාන්‍ය කොටස් | වරණීය කොටස් |
|---|---|---|
| 01.සමාගමේ හිමිකාරිත්වය | | |
| 02.ලාභාංශ අයිතිය | | |
| 03. ඡන්ද අයිතිය/බලය | | |
| 04. පරිපාලන බලය | | |

## ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමක් අරමුදල් රැස් කර ගැනීමට සමාගමේ කොටස් මහජනතාවට නිකුත් කරයි.එලෙස කොටස් නිකුත් කර ලබා ගන්නා ප්‍රාග්ධනය **ප්‍රකාශිත ප්‍රාග්ධනය** වේ.

සමාගම් පනතේ 58 වගන්තියට අනුව " කොටස් නිකුත් කිරීම සම්බන්ධයෙන් සහ කොටස් මත වූ ඇරයුම සම්බන්ධයෙන් සමාගමට ලැබුණු හා ලැබිය යුතු සියලු මුදල්වල එකතුව" **ප්‍රකාශිත ප්‍රාග්ධනය** වේ.

**ක්‍රියාකාරකම 03**

සීමා සහිත නිලූකා සමාගම සංස්ථාපනය කළ වහාම සාමාන්‍ය කොටස් 50000 ක් කොටසක් රු.18 බැගින් නිකුත් කර මුදල් ලබා ගන්නා ලදී.සමාගමේ ප්‍රකාශ කළ ප්‍රාග්ධනය කොපමණ ද?

**ක්‍රියාකාරකම 04**


සීමා සහිත ඡානක සමාගම සාමාන්‍ය කොටස් 80000 ක් පහත සඳහන් පරිදි මුදල් ලබා ගැනීම සඳහා නිකුත් කරඇත.

| | |
|---|---|
| අයදුමේදී කොටසකට | රු.12 |
| ඇරයුමේ දී කොටසකට | රු .8 |

ඇරයුම කැඳවා ඇත.සමාගමේ ප්‍රකාශ කළ ප්‍රාග්ධනය ගණනය කරන්න.

## කොටසක ප්‍රතිෂ්ඨාව

කොටසක ප්‍රතිෂ්ඨාව යනු කොටසක නිකුතු අගයයි. සමාගම් පනතේ 52 වගන්තියට අනුව සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලය කොටසක ප්‍රතිෂ්ඨාව තීරණය කරයි.



# නිපුණතාව 12 : - සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

## නිපුණතා මට්ටම 12.2 : - කොටස් නිකුතුවේ දී ප්‍රතිෂ්ඨාව එකවර ලබාගන්නා විට එම ගනුදෙනු ගිණුම්ගත කරයි.

**ඉගෙනුම් පල :-**

- කොටසක ප්‍රතිෂ්ඨාව පැහැදිලි කරයි.
- කොටසක ප්‍රතිෂ්ඨාව ලබාගන්නා ක්‍රම නම් කරයි.
- කොටස් ප්‍රතිෂ්ඨාව මුදලින් එකවර ලබාගන්නා විට ගිණුම් පිළියෙල කරයි.

**ක්‍රියාකාරකම 01**

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. කොටසක් යනු කුමක් ද?

02. කොටසක ප්‍රතිෂ්ඨාව යනු කුමක් ද?

03. සීමා සහිත පොදු සමාගමකට ප්‍රාග්ධනය සපයා ගන්නේ කෙසේ ද?

04. කොටසක ප්‍රතිෂ්ඨාව තීරණය කිරීම හා ඒ සඳහා අනුමැතිය ලබා ගත යුත්තේ කෙසේ ද?

05. කොටසක ප්‍රතිෂ්ඨාව පියවිය හැකි ආකාර මොනවා ද?

### සමාගමක කොටස් නිකුත් කිරීම සිදු කළ හැකි අවස්ථා

- මූලික ප්‍රසිද්ධ නිකුතුවක් මඟින්
- පරිණත ප්‍රසිද්ධ කොටස් නිකුතුවක් මඟින්

### කොටසක ප්‍රතිෂ්ඨාව එකවර ලබා ගැනීමට අදාළ ජ'නල් සටහන්

- **අයදුම්පත් සමඟ මුදල් ලබා ගැනීම.**

| | | | |
|---|---|---|---|
| මුදල් පාලන ගිණුම | (හර) | XX | |
| කොටස් නිකුත් කිරීමේ ගිණුම | | | XX |

- **කොටස් විභජනය කිරීම.**

| | | | |
|---|---|---|---|
| කොටස් නිකුත් කිරීමේ ගිණුම | (හර) | XX | |
| ප්‍රකාශිත ප්‍රාග්ධන ගිණුම | | | XX |

## සමානුපාතික විභජනය

කිසියම් අනුපාතයකට හෝ අනුපාත කිහිපයක් පදනම් කර ගනිමින් කොටස් විභජනය කිරීම **සමානුපාතික විභජනය** නමින් හඳුන්වයි.

- ♣ **සමාගම නිකුත් කරන ලද කොටස් ප්‍රමාණයකට වඩා වැඩියෙන් අයදුම්පත් ලද විටෙක වැඩිපුර ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කර මුදල් ආපසු යැවීම.**

| | | |
|---|---|---|
| කොටස් නිකුත් කිරීමේ ගිණුම (හර) | xx | |
| මුදල් පාලන ගිණුම | | xx |

**ක්‍රියාකාරකම 02**

සීමා සහිත රමේෂ් සමාගම රු.80 සාමාන්‍ය කොටස් 50000 ක් මහජනයා වෙත නිකුත් කළේය. කොටස් 60000 ක් සඳහා අයදුම්පත් ලැබුණි.සමාගම වැඩිපුර ලද මුදල් කොටස් හිමියන්ට ආපසු යැවීය.ඉතිරි කොටස් විභජනය කරන ලදී.

අවශ්‍ය වන්නේ

01. පහත දැක්වෙන ගිණුම්වල වාර්තා කිරීම.

සීමා සහිත රමේෂ් සමාගම

මුදල් පාලන ගිණුම

කොටස් නිකුත් කිරීමේ ගිණුම

ප්‍රකාශිත සාමානය කොටස් ප්‍රාග්ධන ගිණුම

**ක්‍රියාකාරකම 03**

2018.01.01 දින සීමා සහිත "අරුණලු" සමාගම රු.50 සාමාන්‍ය කොටස් 100000 ක් අයදුම් පත්‍ර සමග මුළු මුදල් ලබා ගැනීම සඳහා මහජනයා ක් වෙත නිකුත් කළේ ය. අයදුම් පත්‍ර භාර ගැනීම 2018.01.31 දින අවසන් විය.එදින වන විට කොටස් 250000 සඳහා මුදල් ලැබී තිබිණි.

අවශ්‍ය වන්නේ

ඉහත සිද්ධිය උපයෝගී කරගෙන පහත ප්‍රශ්නවලට අදාල පිළිතුරු සපයන්න.

(අ) (1) අයදුම් පත්‍ර සමග ලද මුළු මුදල කීය ද?

(2) ප්‍රතික්ෂේප කළ අයදුම් මුදල් කොපමණ ද?

(3) ප්‍රාග්ධනිත කළ වටිනාකම කොපමණ ද? /විභජනය කළ කොටස්වල වටිනාකම කොපමණ ද?

(ආ) මුදල් පාලන ගිණුමට සියලු අයදුම් මුදල් ලැබුණි නම් ගනුදෙනු කිරීමට අවශ්‍ය ජ'නල් සටහන් දක්වන්න.

(1) ………………………………………………………... හර

……………………………………………………………… බැර

( )

(2) ……………………………………………………………… හර

……………………………………………………………….. බැර

( )

(3) ……………………………………………………………… හර

……………………………………………………………… බැර

( )

**ක්‍රියාකාරකම 04**

සීමිත ලෝචන සමාගම 2018.01.01 දින රු.60 බැගින් වූ කොටස් ප්‍රමාණයක් එකවර මුදල් ලබා ගැනීමට නිකුත් කළේ ය.කොටස් නිකුතුවට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | පැරණි කොටස්කරුවෝ | සේවකයෝ | දේශීය ව්‍යාපාරිකයෝ | විදේශිකයෝ | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| අයදුම් කළ කොටස් ගණන | 50000 | 200000 | 300000 | 50000 | ……….. |
| විභජනය කළ කොටස් ගණන | ……… | ……… | 100000 | ………. | ………. |
| විභජන අනුපාතය | 1:1 | 2:1 | ……….. | 5:1 | ……… |

අවශ්‍ය වන්නේ

(1) අයදුම්පත්‍ර සමඟ ලද මුළු මුදල වාර්තා කිරීමේ ජ'නල් සටහන

…………………………………………………………………… හර

………………………………….. ………………………… බැර

( )

(2) ආපසු යැවූ මුදල වාර්තා කිරීමේ ජ'නල් සටහන

…………………………………………………………………… හර

…………………………………………………………………… බැර

( )

(3) ප්‍රාග්ධනිත කිරීමට අදාළ ජ'නල් සටහන

……………………………………………………………………. හර

……………………………………………………………………. බැර

( )

# නිපුණතාව 12 ː - සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

## නිපුණතා මට්ටම 12.3 ː - සංචිත ප්‍රාග්ධනිත කිරීම හා හිමිකම් නිකුතුව සම්බන්ධ ගනුදෙනු ගිණුම් ගත කරයි.

**ඉගෙනුම් පල ː-**

- හිමිකම් කොටස් නිකුතුව පැහැදිලි කරයි.
- සංචිත ප්‍රාග්ධනිත කිරීම පැහැදිලි කරයි.
- හිමිකම් කොටස් නිකුතුව හා සංචිත ප්‍රාග්ධනිත කිරීම අතර සමාන අසමානකම් දක්වයි.
- හිමිකම් කොටස් නිකුතුව හා සංචිත ප්‍රාග්ධනිත කිරීම ගිණුම්ගත කරයි.

### හිමිකම් කොටස් නිකුතුව

සීමිත සමාගමක දැනට සිටින සාමාන්‍ය කොටස් හිමියන්ට මුදල් අය කර ගෙන කිසියම් අනුපාතයකට කොටස් නිකුත් කිරීම.

**හිමිකම් කොටස් නිකුතුවට අදාළ ජ'නල් සටහන**

| | |
|---|---|
| මුදල් ගිණුම | හර |
| සාමාන්‍ය කොටස් ප්‍රකාශිත ප්‍රාග්ධන ගිණුම | බැර |

(…………………….. අනුපාතයකට හිමිකම් කොටස් නිකුත් කිරීම )

### සංචිත ප්‍රාග්ධනිත කිරීම

සීමිත සමාගමක දැනට සිටින සාමාන්‍ය කොටස් හිමියන්ට මුදල් අය කර නොගෙන සංචිත භාවිත කර කිසියම් අනුපාතයකට කොටස් නිකුත් කිරීම.

### සංචිත ප්‍රාග්ධනිත කිරීමට අදාළ ජ'නල් සටහන

| | |
|---|---|
| අදාළ සංචිත ගිණුම | හර |
| සාමාන්‍ය කොටස් ප්‍රකාශිත ප්‍රාග්ධන ගිණුම | බැර |

(………………… අනුපාතයකට සංචිත ප්‍රාග්ධනිත කිරීමට කිරීම )

**ක්‍රියාකාරකම 01**

පහත සඳහන් වගු සම්පූර්ණ කරන්න.

(1) හිමිකම් කොටස් නිකුතුව හා සංචිත ප්‍රාග්ධනිත කිරීම අතර අසමානතා

| නිර්ණායකය | හිමිකම් කොටස් නිකුතුව | සංචිත ප්‍රාග්ධනිත කිරීම |
|---|---|---|
| මුදල් ප්‍රවාහය | | |
| මුළු හිමිකම | | |
| සංචිත භාවිත කිරීම | | |
| කොටස්කරුවන්ගේ ප්‍රමාණය | | |

(2) හිමිකම් කොටස් නිකුතුව හා සංචිත ප්‍රාග්ධනිත කිරීම අතර සමාන ලක්ෂණ

| |
|---|
| 1. |
| 2. |

**ක්‍රියාකාරකම 02**

සීමාසහිත ඇතුගල්පුර පොදු සමාගමේ 2018.01.01 දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (උද්ධෘතය)

(රු.000)

| | | |
|---|---|---|
| **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | |
| සාමාන්‍ය කොටස් (100000) | | 4000 |
| **සංචිත** | | |
| ප්‍රත්‍යාගණන සංචිත | 1000 | |
| පොදු සංචිත | 500 | |
| රඳවා ගත් ඉපැයුම් | 2000 | 3500 |

2018.01.01 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත තීරණ ගන්නා ලදී.

1. සමාගමේ දැනට තිබෙන සෑම සාමාන්‍ය කොටස් 4:1 බැගින් රු.40 ක ප්‍රතිෂ්ඨාවකට රඳවාගත් ඉපයුම් ප්‍රාග්ධනිත කිරීම.
2. සංචිත ප්‍රාග්ධනිත කිරීමට පෙර පැවති සෑම සාමාන්‍ය කොටස් 5:1 බැගින් රු.50 ක ප්‍රතිෂ්ඨාවක් මත හිමිකම් කොටස් නිකුතුවක් කිරීම.

අවශ්‍ය වන්නේ :

1. ඉහත ගනුදෙනු හා සිද්ධිවලට අදාළ ජ'නල් සටහන් දැක්වීම.
2. ඉහත ගනුදෙනු හා සිද්ධි වාර්තා කිරීමට අවශ්‍ය ලෙජර් ගිණුම් පිළියෙල කිරීම.
3. ඉහත ගනුදෙනු හා සිද්ධි වාර්තා කිරීමෙන් පසු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උද්ධෘතයන් දැක්වීම.

## නිපුණතාව 12 : - සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

## නිපුණතා මට්ටම 12.4.1 : - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

**ඉගෙනුම් පල :-**

- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමිතයේ නිර්දේශ අනුව ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කරයි.
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරයි.
- හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය පිළියෙල කරයි.
- මූල්‍ය ප්‍රකාශනවල සටහන් ඉදිරිපත් කරයි.

### සීමා සහිත පොදු සමාගමක අවශ්‍යතා දෙකක් පදනම් කරගෙන පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශන

1.විශේෂ පරමාර්ථ සඳහා

2.පොදු පරමාර්ථ සඳහා

### 1.විශේෂ පරමාර්ථ සඳහා මූල්‍ය ප්‍රකාශන

මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකාරිත්ව අවශ්‍යතා සඳහා සියලු තොරතුරු ඇතුළත් කරමින් පිළියෙල කරන අතර ඒවා **විස්තරාත්මක මූල්‍ය ප්‍රකාශන** නමින් හඳුන්වයි.

### 2.පොදු පරමාර්ථ සඳහා මූල්‍ය ප්‍රකාශන

මෙම මූල්‍ය ප්‍රකාශන බාහිර පාර්ශවයන්ගේ අවශ්‍යතා මත පොදුවේ ගිණුම්කරණ තොරතුරු සැපයීම සඳහා පිළියෙල කරයි.

### පොදු පරමාර්ථ සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අදාළ කර ගත යුතු නිර්දේශ හා විධිවිධාන

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි නිර්දේශ හා ආකෘති හා මඟපෙන්වීම්
- මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවේ නිර්දේශ
- 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන
- ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත කමිටු මඟපෙන්වීම්

## පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශනවල සංරචක

1. ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
2. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
3. හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
4. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
5. ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්

……………………………………………….. සමාගම

……………………….... දිනෙන් අවසන් වසර සඳහා

ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

(රු.000)

| | සටහන් | රු. | රු. |
|---|---|---|---|
| විකුණුම් | | | xx |
| විකුණුම් පිරිවැය | | | ( xx ) |
| දළ ලාභය | | | xx |
| වෙනත් ආදායම් | 01 | | xx |
| බෙදාහැරීමේ වියදම් | | x | |
| පරිපාලන වියදම් | | x | |
| වෙනත් වියදම් | | x | |
| මූල්‍ය වියදම් | | x | ( xx ) |
| බදු පෙර ශුද්ධ ලාභය | 02 | | xx |
| වර්ෂයේ ආදායම් බදු | 03 | | xx |
| කාලච්ඡේදයේ ලාභය | | | xx |
| **වෙනත් විස්තීර්ණ ආදායම** | | | |
| දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අතිරික්ත වෙනස්වීම් | | | xx |
| මුළු විස්තීර්ණ ආදායම | | | xx |

……………………………………………….. සමාගම

………………………………………….. දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(රු.000)

| **ජංගම නොවන වත්කම්** | සටහන් | වටිනකම | වටිනාකම |
|---|---|---|---|
| දේපළ පිරියත හා උපකරණ | 04 | | XXX |
| භාවිත අයිතිය සහිත වත්කම් | 05 | | XXX |
| ආයෝජන (දිගුකාලීන) | | | XXX |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 06 | XX | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | | XX | |
| අනෙකුත් ජංගම වත්කම් | 07 | XX | XXX |
| මුදල් හා මුදල් සමාන අයිතම | | XX | |
| මුළු වත්කම් | | | XXX |
| **හිමිකම් හා වගකීම්** | | | |
| **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | | XX |
| **සංචිත** | | | |
| ප්‍රත්‍යාගණන සංචිතය | | XX | |
| පොදු සංචිතය | | XX | |
| රඳවා ගත් ඉපයුම් | | XX | XX |
| **ජංගම නොවන වගකීම්** | | | |
| බැංකු ණය | | XX | |
| කල්බදු ණයහිමියෝ | | XX | XX |
| **ජංගම වගකීම්** | | | |
| කල්බදු ණයහිමියෝ (ජංගම) | | XX | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | XX | |
| දිගුකාලීන ණයවල ජංගම කොටස | | XX | |
| කෙටිකාලීන ප්‍රතිපාදන | | XX | |
| අනෙකුත් ජංගම වගකීම් | | XX | |
| කෙටිකාලීන ණය/අයිරාව | | XX | XX |
| මුළු ස්කන්ධය හා වගකීම් | | | XXX |

……………………………………………….. සමාගම

……………………...... දිනෙන් අවසන් වසර සඳහා

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(රු.000)

| විස්තරය | සාමාන්‍ය කොටස් | ප්‍රත්‍යාගණන සංචිත | පොදු සංචිත | රඳවාගත් ඉපයුම් | එකතුව |
|---|---|---|---|---|---|
| ඉදිරියට ගෙන ආ ශේෂය | xx | xx | xx | xx | xx |
| කොටස් නිකුතුව | xx | | | | xx |
| මුළු විස්තීර්ණ ආදායම | | xx | | xx | xx |
| හිමිකම් නිකුතුව | xx | | | | xx |
| සංචිත ප්‍රාග්ධනිත කිරීම | xx | (xx) | (xx) | (xx) | |
| පොදු සංචිතයට මාරු කිරීම් | | | xx | (xx) | - |
| අතුරු ලාභාංශ -සාමාන්‍ය කොටස් | | | | (xx) | (xx) |
| අවසාන ශේෂය | xx | xx | xx | xx | Xx |

## සීමාසහිත පොදු සමාගම්වල මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු සටහන් හා ප්‍රතිපත්ති

**(1) වෙනත් ආදායම්** **රු.**

| | |
|---|---|
| ලද වට්ටම් | xx |
| ලද කොමිස් | xx |
| කුලී ආදායම | xx |
| පොලී ආදායම | xx |
| ලාභාංශ ආදායම | xx |
| දේපළ පිරියත හා උපකරණ ලාභ | xx |
| | xxx |

**(2) බදු පෙර ලාභය ගණනය කිරීමේ දී අදාළ කර ගත් අයිතමයන්**

| | රු. |
|---|---|
| දේපළ පිරියත හා උපකරණ ක්ෂයවීම් | xx |
| දේපළ පිරියත හා උපකරණ ඉවත් කිරීමේ අලාභ | xx |
| ප්‍රත්‍යාගණන අලාභ | xx |
| කල්බදු පොලී | xx |
| වගකීම් සහතික වීම් | xx |
| තොග කපාහැරීම | xx |
| සේවක වන්දි | xx |
| අධ්‍යක්ෂ මණ්ඩල වැටුප්/වේතන/දීමනා | xx |
| විගණන ගාස්තු | xx |
| සේවක අර්ථ සාධක අරමුදල් | xx |
| සේවක භාරකාර අරමුදල් | xx |
| පරිත්‍යාග | xx |
| ණය පොලී | xx |

**(3) ආදායම් බදු**

| | |
|---|---|
| වසරේ ලාභය මත බද්ද | xx |
| ඌන බදු/අධි බදු වෙන් කිරීම | x(x) |
| | xx |

**(4) දේපල පිරියත හා උපකරණ**

(රු.000)

| | ඉඩම් | ගොඩනැගිලි | මෝටර් රථ | යන්ත්‍ර | කාර්යාල උපකරණ | පරිගණක | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ආරම්භක ශේෂය | xxx | xxx | xxx | xxx | xxx | xxx | xxx |
| මිලට ගැනීම් | - | xxx | - | - | - | xxx | xxx |
| ප්‍රත්‍යාගණනය | xxx | xxx | - | - | - | - | xxx |
| ඉවත් කිරීම් | - | - | (xx) | - | - | - | (xx) |
| ප්‍රත්‍යාගණනයමත ක්ෂය | - | (xxx) | - | - | - | - | (xxx) |
| අවසාන ශේෂය | xxx | xxx | xxx | xxx | xxx | xxx | xxx |
| **සමුච්චිත ක්ෂය** | | | | | | | |
| ආරම්භක ශේෂය | xxx | xxx | xxx | xxx | xxx | xxx | xxx |
| වාර්ෂික ක්ෂය | | xxx | xxx | xxx | xxx | xxx | xxx |
| ඉවත් කිරීම් | - | - | (xx) | - | - | - | (xx) |
| ප්‍රත්‍යාගණනයමත ක්ෂය | - | (xxx) | - | - | - | - | (xxx) |
| අවසාන ශේෂය | - | xxx | xxx | xxx | xxx | xxx | xxx |
| ශුද්ධ අගය | xxx | xxx | xxx | xxx | xxx | xxx | xxx |

**(5) භාවිත අයිතිය සහිත වත්කම්** **රු.**

| | |
|---|---|
| මූලික මිනුම් කිරීමේ දී පිරිවැය | xxx |
| සමුච්චිත ක්ෂය | (xx) |
| ධාරණ අගය | xxx |

**(6) වෙළෙඳ ලැබිය යුතු දෑ** **රු.**

| | |
|---|---|
| වෙළෙඳ ලැබිය යුතු දෑ | xx |
| වෙළෙඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ සඳහා ඉඩහැරීම | (x) |
| | xx |

**(7) මුදල් හා සමාන දෑ**

| | රු. |
|---|---|
| සුළු මුදල් ශේෂය | xx |
| මුදල් | xx |
| භාණ්ඩාගාරික බිල් (ත්‍රෛමාසික) | xx |
| | xx |

**(8) මූල්‍ය ප්‍රකාශන සමඟ අනාවරණය කළ යුතු ගිණුම් තැබීමේ දී හා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී භාවිත කරන ලද ප්‍රතිපත්ති**

1. තොග අගය කිරීමේ දී භාවිත කළ පිරිවැය සූත්‍ර FIFO/WAC
2. වත්කම් අගය කර ඇති පදනම පිරිවැය/ප්‍රත්‍යාගණන අගය ද යන වග
3. ව්‍යාපාරය එළඹ ඇති විවිධ ගිවිසුම්

**අභ්‍යාස 01**

සීමිත මිලානෝ සමාගමේ 2018/2019 ගිණුම් වර්ෂය සඳහා අදාළ ආදායම් හා වියදම් අයිතම පහත දැක්වේ.

| | ( රු.000) |
|---|---|
| විකුණුම් ආදායම | 40600 |
| ගැනුම් | 25000 |
| ආරම්භක තොගය 2018.04.01 | 4000 |
| ගෙනප්මේ කුලී | 1000 |
| ආපසු එවුම් | 600 |
| ආපසු යැවුම් | 500 |
| මෝටර් රථ විකිණීමේ ලාභ | 100 |
| ගෙවල් කුලී ආදායම් | 600 |
| බැංකු තැන්පතු පොලී | 300 |
| වේතන හා වැටුප් | 4000 |
| ගිණුම්කරණ වියදම් | 200 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ | 170 |
| ණය පොලී | 30 |
| තොග පරිත්‍යාග | 50 |
| අධ්‍යක්ෂ ගාස්තු | 2600 |
| විගණන ගාස්තු | 160 |
| වගකීම් සහතික වීම | 140 |
| ගොඩනැගිලි ක්ෂය | 80 |
| බෙදාහැරීමේ රථ ක්ෂය | 120 |
| වෑන් රථයේ දුම් සහතික හා ආදායම් බලපත්‍ර ගාස්තු | 40 |
| දුරකථන හා විදුලිය වියදම් | 200 |
| ප්‍රචාරණ වියදම් | 100 |

| | |
|---|---|
| කල්බදු පොලී | 60 |
| EPF වියදම | 600 |
| ETF වියදම | 120 |
| අනෙකුත් පරිපාලන වියදම් | 1230 |
| අනෙකුත් බෙදාහැරීමේ වියදම් | 150 |
| අනෙකුත් මූල්‍ය වියදම් | 50 |
| ඉඩම් මුල්වරට ප්‍රත්‍යාගණනය කිරීමෙන් ලද ලාභය | 2000 |

**අනෙකුත් තොරතුරු**

1.2019.03.31 දිනට තොගයේ පිරිවැය රු.3500000 කි.එහි ශුද්ධ උපලබ්ධි අගය රු.3200000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

2.ආදායම් බදු ,බදු පෙර ලාභයෙන් 1/5 කි.

**අවශ්‍ය වන්නේ:**

1. ඉහත දත්ත ඇසුරෙන් සීමිත මිලානෝ සමාගමේ 2019.03.31 න් අවසන් වසර සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කරන්න.

2. සීමිත මිලානෝ සමාගමේ 2019.03.31න් අවසන් වසරට අදාළ ගිණුම්කරණ සටහන් දක්වන්න.

**අභ්‍යාස 02**

(1) සීමිත වාරියපොළ පොදු සමාගමේ 2018.04.01 දිනට හිමිකම් අයිතම පහත දැක්වේ.

| | (රු.000) |
|---|---|
| රු.50 සාමාන්‍ය කොටස් (2000000) | 100000 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය (ඉඩම්) | 4000 |
| පොසංචිතය | 22500 |
| රඳවා ගත් ඉපැයුම් | 3500 |

(2) සීමිත වාරියපොළ පොදු සමාගමේ 2019.03.31 දිනට ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙන් උපුටා ගත් තොරතුරු

| | |
|---|---|
| කාලච්ඡේදයේ ලාභය (බදු පසු) | රු. 6500000 |
| ඉඩම වසර තුළ ප්‍රත්‍යාගණනයෙන් ලැබූ අතිරික්තය | රු. 2000000 |

මුළු විස්තීර්ණ ආදායම                                        රු. 8500000

(3) සීමිත වාරියපොළ පොදු සමාගමේ 2019.03.31 න් අවසන් වසර තුළ හිමිකම් වෙනස් වීමට ඉවහල් වූ ගනුදෙනු පහත දැක්වේ.

(1) 2018.04.01 දින රු.50 සාමාන්‍ය කොටස් 50000 ක් මහජනයා වෙත නිකුත් කිරීම.කොටස් 60000 කට මුදල් ලැබී අයඳුම්කරුවන් අතර කොටස් සමානුපාතිකව විභජනය කර වැඩිපුර ලද මුදල් ආපසු යැවී ය.

(2) 2018.07.01 දින අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් 2018.04.01 කොටස් නිකුතුවට පෙර තිබූ සෑම සාමාන්‍ය කොටස් 5:1 බැගින් රු.50 ක ප්‍රතිෂ්ඨාවක් මත සංචිත ප්‍රාග්ධනීකරණය සිදු කිරීම මේ සඳහා පොදු සංචිත භාවිත කිරීමට තීරණය විය.

(3) 2018.10.01 දින රු.50 සාමාන්‍ය කොටස් 20000 ක හිමිකම් නිකුතුවක් සිදු කිරීම.සියලු කොටස්ලාභීහු හිමිකම් කොටස් ලබාගත්හ.

(4) අධ්‍යක්ෂ මණ්ඩලය 2019.03.31 දින මේ වසරේ ලාභයෙන් රු.1000000 ක් පොදු සංචිතයට මාරු කිරීමට,සාමාන්‍ය කොටස් සඳහා රු.3000000 ක අවසන් ලාභාංශයක් යෝජනා කර ඇත.කෙසේ වුව ද වසර තුළ සාමාන්‍ය කොටස් හිමියන්ට රු.2000000 ක ලාභාංශයක් ගෙවා ඇත.

අවශ්‍ය වන්නේ ：

1. සීමිත වාරියපොළ පොදු සමාගමේ 2019.03.31 න් වසර සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය පිළියෙල කිරීම.
2. සීමිත වාරියපොළ පොදු සමාගමේ 2019.03.31 න් අවසන් වසරට ඉහත ගනුදෙනු හා සිද්ධීන් තුළින් අදාළ ගිණුම්කරණ සටහන් දක්වන්න.
3. ඉහත සිද්ධීන් වාර්තා කිරීමට අවශ්‍ය සටහන් හා ලෙජර් ගිණුම් දැක්වීම.

**අභ්‍යාස 03**

සීමිත මෙත්ලිනී සමාගමේ 2019.03.31 දිනෙන් අවසන් වසර සඳහා ලාභ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය පිළියෙල කිරීමෙන් පසු ගිණුම් පොත්වලින් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

| | (රු.000) |
|---|---|
| 2019.03.31 දිනට තොගය | 7800 |
| සාමාන්‍ය කොටස්වල ආයෝජනය | 6000 |
| ස්ථාවර තැන්පතුවල (වසර 3ක්) | 2500 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 6425 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 9165 |
| 12% බැංකු ණය | 3600 |
| ඉදිරියට කළ රක්ෂණය (2019.03.31) | 60 |
| 2019.03.31 උපචිත ආදායම් බදු | 480 |
| 2019.03.31 දිනට ගෙවිය යුතු බැංකු ණය | 65 |
| දේපළ පිරියත හා උපකරණ (ශුද්ධ අගය) | 19840 |
| 2019.03.31 දිනට වෙළෙඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීම | 25 |
| 2019.03.31 උපචිත විදුලි ගාස්තු | 40 |
| මුදල් හා මුදල් සමාන දෑ | 8750 |
| ප්‍රත්‍යාගණන සංචිත | 8200 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සමාන්‍ය කොටස්) | 16800 |
| කල්බදු ණයහිමියෝ | 5700 |
| කල්බදු ණයහිමි ගිණුමේ ජංගම කොටස | 300 |
| පොදු සංචිතය | 2300 |
| රඳවා ගත් ඉපයුම් | 4700 |

අවශ්‍ය වන්නේ : සීමිත මෙත්ලිනී සමාගමේ 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**අභ්‍යාස 04**

සීමිත ලකිර සමාගමේ 2019.03.31 දිනට පිළියෙල කළ ගිණුම් වාර්තාවලින් පහත ශේෂ උපුටා ඇත.

2018.04.01 දිනට දේපළ පිරියත උපකරණ හා ක්ෂය වෙන්කිරීම් (රු.000)

| | පිරිවැය | සමුච්චිත ක්ෂය |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි (ඉඩමේ පිරිවැය 4000 | 7500 | 850 |
| බෙදාහැරීමේ වෑන් රථ | 10000 | 3200 |
| යන්ත්‍ර උපකරණ | 6000 | 2500 |
| ලී බඩු හා සවිකිරීම් | 2700 | 700 |
| පරිගණක පද්ධති | 4000 | 1500 |

අමතර තොරතුරු :

1. 2018/2019 ගිණුම් වසර තුළ දී ඉඩම්වල අගය රු.6000000 කට ප්‍රත්‍යාගනනය කර ඇත.
2. පිරිවැය රු.3000000 ක් වූ වෑන් රථයක් 2019.03.31 දින පවරා දී රු.5000000 ක් වූ නව මෝටර් රථයක් ලබා ගන්නා ලදී. හුවමාරු කිරීමේ දී පැරණි රථය සමඟ මුදලින් රු.2800000 ක් ගෙවන ලදී. හුවමාරු කළ රථයේ හුවමාරු කළ දිනය වන විට රු.1500000 ක් සමුච්චිත ක්ෂය සිදු කර ඇත.
3. පිළිවෙලින් ගොඩනැගිලි ,බෙදාහැරීමේ වෑන් රථ,යන්ත්‍ර උපකරණ,ලී බඩු හා සවිකිරීම් හා පරිගණක රු.400000,800000,500000,300000 ක් හා 1000000 ක් බැගින් වාර්ෂිකව ක්ෂය කළ යුතු වේ.

අවශ්‍ය වන්නේ :

1. ඉහත තොරතුරු ඇසුරෙන් සීමිත ලකිර සමාගමේ දේපළ පිරියත හා උපකරණ සටහන පිළියෙල කරන්න.

**අභ්‍යාස 05**

සීමිත අභිෂේක පොදු සමාගමේ 2019 මාර්තු 31 දිනට උපුටගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ.

(රු.000)

| ගිණුමේ නම | හර | හැර |
|---|---|---|
| විකුණුම් | | 80600 |
| විකුණුම් පිරිවැය | 52000 | |
| විදුලිය,වරිපනම් හා රක්ෂණ | 150 | |
| ප්‍රචාරණය හා විකුණුම් ප්‍රවර්ධන පිරිවැය | 400 | |
| ගෙනයාමේ කුලී | 100 | |
| අධ්‍යක්ෂ සංවේතන | 2000 | |
| වැටුප් හා වේතන | 1820 | |
| ගෙවූ ණයපොලී | 800 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 3050 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 1700 |
| ගෙවූ ලාභාංශ | 2000 | |
| ඉඩම් හා ගොඩනැගිලි | 30000 | |
| මෝටර් රථ | 44000 | |
| කාර්යාල උපකරණ | 3000 | |
| බැංකු ශේෂය | 3870 | |
| හානිකරණ අලාභ | 100 | |
| ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් | 400 | |
| 2018.04.01 හානිකරණ අලාභ සඳහා ඉඩහැරීම | | 200 |
| විගණන ගාස්තු හා වියදම් | 400 | |
| පොදු සංචිත | | 2000 |
| 2018.04.01 සමුච්චිත ක්ෂය | | |
| ගොඩනැගිලි | | 2500 |
| මෝටර් රථ | | 7800 |
| කාර්යාල උපකරණ | | 700 |
| 2018/2019 බදු වෙන්කිරීම් | | 100 |
| ගෙවූ ආදායම් බදු | | |
| 2017/2018 | 180 | |
| 2018/2019 | 200 | |
| 2019.03.31 දිනට තොග | 3500 | |
| රඳවාගත් ඉපයුම් | | 3200 |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 40000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 4800 |
| වෙනත් ආදායම් | | 350 |
| වාහන දුම් බලපත්‍ර ගාස්තු | 30 | |
| 12% ස්ථාවර තැන්පතු | 2000 | |
| 15% දිගුකාලීන ණය | | 6000 |
| | 150000 | 150000 |

අමතර තොරතුරු ඃ

01. 2018.04.01 දින ව්‍යාපාරය සතු ඉඩමක් වෘත්තීය තක්සේරුකාර ආයතනයක් විසින් රු.1000000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. එදිනට ඉඩමේ ධාරණ අගය රු.500000 ක් විය. මෙම ඉඩම 2017/2018 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කරන ලද අතර එදින පැවති වෙළෙඳපොළ තත්ත්වය අනුව රු.100000 ක ප්‍රත්‍යාගණන අලාභයක් වාර්තා කර ඇත.

02. ගොඩනැගිලිවල පිරිවැය රු.10000000 ක් විය.දේපළ පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමයට පහත දැක්වෙන අනුපාතවලට වාර්ෂිකව ක්ෂය කළ යුතුය.

ගොඩනැගිලි 5% , මෝටර් රථ 10% , කාර්යාල උපකරණ 10%

2013.10.01 දින මිලට ගෙන තිබූ පිරිවැය රු.1000000 ක් වූ මෝටර් රථයක් 2018.10.01 දින රු.60000 කට විකුනා ඇත.විකිනීමෙන් ලද මුදල විකුණුම් ගිණුමට බැර කර ඇත.ඒ පිළිබඳ වෙනත් සටහන් තබා නැත.

03. 2019.03.31 දිනට (FIFO ක්‍රමයට) ආගණනය කළ තොගයේ ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි අගය රු.3600000 ක් වේ.2019.03.31 දිනෙන් පසුව නමුත් අධ්‍යක්ෂවරු මූල්‍ය වාර්තා අනුමත කිරීමට පෙර මෙම තොගය රු.3400000 කට විකුණා ඇත.

04. 2019.03.31 දිනට පැවති රු.100000 ණයගැතියකු බංකොලොත් වී ඇති බව 2019 අප්‍රේල් 20 දින දැනගන්නට ලැබී ඇති අතර ඔහුට දී ඇති නඩු තීන්දු ප්‍රකාර ඔහුගෙන් අය කර ගත හැක්කේ රුපියලකට ශත 50 ක සමානුපාතික අගයක් පමණක් වේ.මේ සඳහා ගැළපුම් ඉටු කිරීමෙන් පසු ඉතිරි ණයගැතියන්ගෙන් 10%ක හානිකරණ අලාභ සඳහා ඉඩහැරීමක් ඇති කළ යුතුය.

05. 2019.03.31 දිනට උපචිත වියදම් පහත දැක්වේ.

| | |
|---|---|
| විදුලිය හා වරිපනම් | රු. 50000 |
| වැටුප් හා වේතන | රු. 80000 |
| විගණන ගාස්තු | රු.100000 |

06. ස්ථාවර තැන්පතුව 2018.10.01 දින සිදු කරන ලදී.වාර්ෂික පොලිය තැන්පතුව සිදු කළ දිනට උපලබ්ධි වී ඇත.එය වෙනත් ආදායම් තුළ ඇතුළත් කර ඇති අතර ඉතිරිය භාණ්ඩාගාර බිල්පත් සඳහා ලද පොලිය නියෝජනය වේ.

07. 2017/2018 වර්ෂය සඳහා ආදායම් බද්ද එකඟ වී ගෙවා ඇති අතර 2018/2019 වර්සය සඳහා ආදායම් බද්ද රු.270000 කට ඇස්තමේන්තු කර ඇත.

08. 2018.10.01 දින කාර්යාල උපකරණ මිලට ගැනුම් රු.2000000 ක් යන අතර මෙය අත්වැරදීමකින් ගැනුම් ගිණුමේ වාර්තා කර ඇත.

09. සේවයෙන් ඉවත් කරන ලද සේවකයෙකු රු.600000 ක වන්දියක් ඉල්ලා කම්කරු උසාවියේ නඩුවක් පවරා ඇත. 2019.03.31 දින සමාගමේ නීතිඥවරයාගෙන් කළ විමසීමක දී ඔහුගේ මතය වූයේ සේවකයාගේ ඉල්ලීම සාධාරණ ලෙස ඔප්පු කළ හැකි බැවින් වන්දි ගෙවීමේ අවශ්‍යතාවයක් පැනනැගිය හැකි බව ය.

10. අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වෙන තීරණවලට එළඹී ඇත.

    1. 2019.03.31 දිනට කොටස් 30000 ක සංචිත ප්‍රාග්ධනිත කිරීමට කොටසක ප්‍රතිෂ්ඨාව රු.40 බැගින් වේ.
    2. පොදු සංචිතයට රු.3000000 ක් මාරු කිරීමට
    3. සාමාන්‍ය කොටස් සඳහා රු.2 ලාභාංශයක් ගෙවීමට

අවශ්‍ය වන්නේ :

1. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
2. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
3. 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**අභ්‍යාස 06**

සී/ස අලංකාර පොදු සමාගමේ 2019.03.31 දිනෙන් අවසන් වසරේ පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම පහත දැක්වේ.

( රු000)

| ගිණුමේ නම | හර | හැර |
|---|---|---|
| 2019.03.31 දිනට ප්‍රකාශ කළ ප්‍රාග්ධනය | | 2500 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 600 | |
| 2018.04.01 දිනට තොගය | 200 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 723 |
| ලද වට්ටම් | | 100 |
| හානිකරණ අලාභ | 150 | |
| මුදල් | 3600 | |
| භාණ්ඩාගාර බිල්පත් | 200 | |
| 12% ආයොජන (දිගුකාලීන) | 300 | |
| ආයෝජන ආදායම් | | 30 |
| බැංකු ණය | | 1000 |
| ගැණුම් | 2000 | |
| විකුණුම් | | 8000 |
| අධ්‍යක්ෂ සංවේතන | 10 | |
| 2018.04.01 හානිකරණ අලාභ සඳහා ඉඩහැරීම | | 50 |
| විදුලි වියදම් | 7 | |
| දුරකථන ගාස්තු | 6 | |
| 2018.04.01 දිනට සමුච්චිත ක්ෂය | | 2400 |
| දුන්වට්ටම් | 20 | |
| වෙනත් වියදම් | 110 | |
| ගෙවූ ආදායම් බදු | 1000 | |
| 2019.03.31 දිනට දේපළ පිරියත හා උපකරණ | 10000 | |
| කල් බදු ණයහිමි | | 3000 |
| කල් බදු වාරික | 600 | |
| පොදු සංචිත | | 200 |
| ප්‍රත්‍යාගණන සංචිතය (ඉඩම්) | | 500 |
| 2018.04.01 රඳවා ගත් ඉපයුම් | | 300 |
| | 18803 | 18803 |

2019.03.31 දිනට දේපළ පිරියත හා උපකරණ සංයුතිය පහත දැක්වේ. (රු.000)

| | |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 5000 |
| මෝටර් රථ (කල්බදු ක්‍රමයට ලබාගත්) | 3000 |
| පරිගණක | 2000 |
| | 10000 |

2018.04.01 දිනට දේපළ පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය (රු.000)

| | |
|---|---|
| ගොඩනැගිලි | 1800 |
| පරිගණක | 600 |
| | 2400 |

පහත අමතර තොරතුරු ඔබට සපයා ඇත.

01. 2019.03.31 දිනට තොගයේ පිරිවැය රු.200000 ක් වන අතර එම තොගය 2019.04.05 දින රු.10000 ක වියදමක් දරා රු.190000කට විකුණා ඇත.

02. 2018.10.01 දින ණයට ගත් රු.300000 ක් වටිනා භාණ්ඩ පරිගණක ගිණුමට හර කර වෙළෙඳ ගෙවිය යුතු ගිණුමට බැර කර ඇත.

03. සමාගමේ ප්‍රතිපත්තිය වන්නේ වර්ෂ අවසාන වෙළෙඳ ලැබිය යුතු දෑ මත 10% හානිකරණ අලාභ සඳහා ඉඩහැරීමක් සිදු කිරීම.

04. 2019.01.01 දින රු.500000 ක පරිගණක මිලට ගෙන ඇත.

05. සමාගමේ ගොඩනැගිලිවල අගය රු.2000000 ක් වන අතර 2019.03.31 දින ඉඩම රු.2300000 කට ප්‍රත්‍යාගණනය කර ඇත. මෙම ඉඩම 2017.04.01 දින ප්‍රත්‍යාගණන කර තිබූ අතර එයින් බිහි වූ ප්‍රත්‍යාගණන අතිරික්තය ඉහත ප්‍රත්‍යාගණන සංචිතයේ දක්වා ඇත.

06. සමාගම විසින් 2018.04.01 දින කල්බදු ක්‍රමයට ඉහත මෝටර් රථ අත්පත් කර ගෙන ඇත. මූලික ගෙවීම රු.1000000 ක් වන අතර ඉතිරිය රු.600000 බැගින් වන සමාන වාරික 4 කින් ගෙවිය යුතුය.මෙහි දී අය කරන පොලිය පහත දැක්වේ.

| | |
|---|---|
| 2018/2019 | රු.150000 |
| 2019/2020 | රු.120000 |
| 2020/2021 | රු. 80000 |
| 2021/2022 | රු. 50000 |

සමාගම විසින් ලබාගත් මෙම මෝටර් රථය ගිණුම්වල නිවැරදිව සටහන් කර ඇති අතර ගෙවන ලද මූලික ගෙවීම මුදල් පාලන ගිණුමට බැර කර වෙළෙඳ ගෙවිය යුතු ගිණුමට හර කර ඇත.ඉහත ශේෂ පිරික්සුමේ කල්බදු වාරික ලෙස දක්වා ඇත්තේ ගෙවන ලද කල්බදු වාරිකයකි.

07. සමාගමේ දේපළ පිරියත හා උපකරණ පහත පරිදි ක්ෂය කරයි.

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | (සරල මාර්ග) | 10% |
| මෝටර් රථ | (සරල මාර්ග) | 10% |
| පරිගණක | (සරල මාර්ග) | 4% |

08. සමාගම 2018.10.01 දින රු.20 සාමාන්‍ය කොටස් 25000 නිකුත් කර ඇත.

09. සමාගමේ ආදායම් බදු ,බදු පෙර ලාභයෙන් 1/4 කි.

10. 2019.03.31 දිනෙන් අවසන් වසරේ අධ්‍යක්ෂකවරුන් විසින් පහත තීරණ ගෙන ඇත.

- පොදු සංචිතයට රු.200000 ක් මාරු කිරීම.
- සාමාන්‍ය කොටස් සඳහා 10%ක ලාභාංශ යෝජනා කිරීම.

11. 2019.06.30 අධ්‍යක්ෂවරුන් විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කර ඇත.

අවශ්‍යවන්නේ :

01. 2019.03.31 දිනෙන් අවසන් වසරේ ලාභාලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

02. 2019.03.31 දිනෙන් අවසන් වසරේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

03. 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

# ඇගයීම් සැලසුම

01. විෂය :- ගිණුම්කරණය

02. ශ්‍රේණිය :- 13ශ්‍රේණිය

03. දිනය :-

04. කාලය :- විනාඩි 40

05. නිපුණතාව :- සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

06. නිපුණතා මට්ටම :-- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

07. ක්‍රමවේදය :- කණ්ඩායම් ක්‍රියාකාරකම

08. සුවිශේෂී අරමුණු :-

01. සීමාසහිත සමාගමක ලාභාලාභ හා වෙනත් විස්තර්ණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කරයි.
02. සීමාසහිත සමාගමක හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය පිළියෙල කරයි.
03. සීමාසහිත සමාගමක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරයි.
04. සීමාසහිත සමාගමක ගිණුම්කරණ සටහන් ලියා දක්වයි.

09. අපේක්ෂිත නිපුනතා :- ඉගෙනීමට ඉගෙනීම නිපුනතාව,සන්නිවේදන නිපුනතාව

10. ක්‍රියා පිළිවෙල :-

01. ඇගයීම පිළිබඳවත්, නිර්ණායක පිළිබඳවත් කල් ඇතිව සිසුන් දැනුවත් කරන්න.
02. කණ්ඩායම් බෙදා වෙන්කර ගන්න.
03. කාලච්ඡේද සහ කාලය වෙන්කර ගන්න.
04. කාර්ය පත්‍රිකාව සූදානම් කරගන්න.

11. ඇගයීම් නිර්ණායක හා ලකුණු :-

01. සීමාසහිත සමාගමක ලාභාලාභ හා වෙනත් විස්තර්ණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම.

02. සීමාසහිත සමාගමක හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය පිළියෙල කිරීම.

03. සීමාසහිත සමාගමක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම.

04. සීමාසහිත සමාගමක ගිණුම්කරණ සටහන් ලියා දැක්වීම.

05. කණ්ඩායම් සහයෝගීතාව සහ කාලයට අනුව වැඩ අවසන් කිරීම.

12. ප්‍රතිපෝෂණය :-

13. පසු සටහන් :-

# කාර්ය පත්‍රිකාව

සීමා සහිත ජාලිය සමාගමේ 2019.03.31 න් අවසන් වර්ෂය සඳහා ශේෂ පිරික්සුම උපුටා ගෙන ඇත. (රු.000)

| ගිණුමේ නම | හර | බැර |
|---|---|---|
| ඉඩම | 5000 | |
| ගොඩනැගිලි | 10000 | |
| මෝටර් රථ | 12000 | |
| යන්ත්‍ර උපකරණ | 3000 | |
| 2018.04.01 දිනට සමුච්චිත ක්ෂය | | |
| ගොඩනැගිලි | | 2000 |
| මෝටර් රථ | | 2000 |
| යන්ත්‍ර උපකරණ | | 1000 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය් සාමාන්‍ය කොටස් (කොටස් 150000 ) | | 15000 |
| සංචිත 2018.04.01 දිනට - ප්‍රත්‍යාගණන | | 100 |
| පොදු | | 1000 |
| රඳවාගත් ඉපයුම් | | 2500 |
| වෙළෙඳ ලැබිය යුතු/ වෙළෙඳ ගෙවිය යුතු | 4300 | 3200 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ සඳහා ඉඩහැරීම | | 200 |
| ගෙවූ බදු | 2000 | |
| ගෙවූ ලාභාංශ් සාමාන්‍ය කොටස් | 700 | |
| ආදායම් බදු වෙන්කිරීම 2018.04.01 | | 700 |
| ආයෝජන 10% | 4500 | |
| විකුණුම් | | 32000 |
| විකුණුම් පිරිවැය | 15000 | |
| තොගය 2019.03.31 | 3800 | |
| පරිපාලන වියදම් | 2000 | |
| බෙදාහැරීමේ වියදම් | 1200 | |
| බැංකුණය 12% වාර්ෂික පොලී | | 4000 |
| බැංකු ණය පොලී | 300 | |
| ආයෝජන ආදායම් | | 200 |
| කල්බදු ණයහිමි | | 4000 |
| යන්ත්‍ර විකුණුම් | | 1000 |
| අධ්‍යක්ෂක වේතන | 1000 | |
| විගණන ගාස්තු | 500 | |
| බැංකු ශේෂය | 3600 | |
| | 68900 | 68900 |

අතිරේක තොරතුරු :

01. 2019.03.31 දින තොගය භෞතිකව ගණනය කරන ලද අතර එදිනට රු.500000 ක් වටිනා තොගයක් මාර්ගස්ථව පැවතිණි.

02. 2018.04.01 දින රු.5000000 ක් වටිනා මෝටර්රථයක් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ අත්පත්

කර ගන්නා ලද අතර එය නිවැරදිව ගිණුම් තබා ඇත.2019.03.31 දින සිට සෑම වසරකම රු.1000000 බැගින් වන සමාන වාර්ෂික වාරික 7කින් මෙය ගෙවා නිම කළ යුතුය.2019.03.31 දින පළමු වාරිකය ගෙවා එය නිවැරදිව කල්බදු ණයහිමි ගිණුමට සටහන් කර ඇති අතර ඒ හැර වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

පොලිය - 2018/2019 රු.500000

2019/2020 රු.400000

03. 2019.03.31 දින ව්‍යාපාරයේ ඉඩම් රු.6000000 කට ද ගොඩනැගිලි රු.9000000 කට ද ප්‍රත්‍යාගණනය කර ඇත.

04. 2018.09.30 දින පිරිවැය රු.1400000 ක් වටිනා යන්ත්‍රයක් විකුණා ඇති අතර එදිනට එහි ධාරණ අගය රු.700000 කි.විකිණීමෙන් ලද මුදල යන්ත්‍ර විකුණුම් ගිණුමට සටහන් කිරීම හැර වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

05. 2019.03.31 දිනට පහත වියදම් උපචිතව පැවතිණි.

| | |
|---|---|
| අධ්‍යක්ෂක වේතන | රු. 50000 |
| විගණන ගාස්තු | රු.100000 |

06. දේපළ පිරියත හා උපකරණ පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගය මත වාර්ෂිකව පහත අනුපාතයන්ට ක්ෂය කරනු ලබයි.

| | | | | | |
|---|---|---|---|---|---|
| ගොඩනැගිලි | 5% | යන්ත්‍ර උපකරණ | 10% | මෝටර් රථ | 20% |

07. සමාගමේ සේවකයකු 2018.10.01 දින සේවයෙන් ඉවත්කර ඇති අතර එම සේවකයා වන්දි ඉල්ලා නඩුවක් පවරා ඇත.2019.03.31 දිනට නීතිඥයන්ගේ මතය වූයේ නඩුව ආයතනය විසින් පැරදීමට 80% සම්භාවිතාවක් ඇති බවත් රු.500000 ක වන්දි මුදලක් ගෙවීමට සිදුවන බවත්ය.මේ පිළිබඳව කිසිවක් ගලපා නොමැත.

08. 2017/2018 වර්ෂයට අදාළ අවසාන ආදායම් බදු වගකීම ලෙෂ රු.500000 ක් ගෙවා ඇති අතර 2018/0219 වසරේ මුළු බදු වගකීම රු.1900000 ක් වේ යැයි ගණනය කර ඇත.

09. 2019.03.31 දින රු.10 බැගින් කොටස් 100000 ක හිමිකම් නිකුතුවක් සිදුකර මුදල් ලබාගෙන ඇති අතර මේ සම්බන්ධව කිසිදු සටහනක් තබා නොමැත.

10. වසර අවසාන වෙළෙඳ ලැබිය යුතු ශේෂ මත 10% ක් හානිකරණ අලාභ සඳහා ඉඩහැරීමක්

සිදුකිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

11. 2019.03.31 දින අධ්‍යක්ෂකවරු පහත තීරණ ගෙන ඇත.

- පොදු සංචිතයට රු.500000 ක් මාරු කිරීම.
- සාමාන්‍ය කොටස් සඳහා රු.2 බැගින් ලාභාංශ යෝජනා කිරීම.

අවශ්‍යවන්නේ ඃ

01. 2019.03.31 දිනෙන් අවසන් වසරේ ලාභාලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
02. 2019.03.31 දිනෙන් අවසන් වසරේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
03. 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
04. ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්

## නිපුණතාව 12 ඃ - සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

### නිපුණතා මට්ටම 12.4.2 ඃ - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව සීමාසහිත සමාගමක මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කරයි.

**ඉගෙනුම් පල ඃ-**

- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ගිණුම් ප්‍රමිතයට අනුව පැහැදිලි කරයි.
- මෙහෙයුම් ක්‍රියාකාරකම් පැහැදිලි කරයි.
- ආයෝජන ක්‍රියාකාරකම් පැහැදිලි කරයි.
- මූල්‍ය ක්‍රියාකාරකම් පැහැදිලි කරයි.
- ගිණුම්කරණ ප්‍රමිතයට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කරයි.

### මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඃ-

මූල්‍ය ප්‍රකාශන ප්‍රයෝජනයට ගන්නා පාර්ශවයන්ගේ ආර්ථික තීරණ ගැනීම සඳහා ව්‍යාපාරයක කිසියම් කාලච්ඡේදයක් සඳහා මුදල් හා මුදල් හා සමාන දෑවල සිදු වූ වෙනස්වීම් මෙහෙයුම්, ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් වශයෙන් වර්ග කර මුදල් ජනනය හා භාවිතය නිරූපණය කෙරෙන ප්‍රකාශනයයි.

## ප්‍රමිතයේ සඳහන් නිර්වචන

**01. මුදල් ඃ-** අතැති මුදල් හා ඉල්ලුම් තැන්පතු

උදා ඃ මුදල් ශේෂය,සුළු මුදල් ශේෂය

**02.මුදල් හා සමාන දෑ ඃ-** කිසිදු අවදානමකින් තොර ව මුදල් බවට පරිවර්තනය කළ හැකි ඉතා ඉහළ ද්‍රවශීලතාවෙන් යුත් කෙටිකාලීන ආයෝජන වේ.

උදා ඃ භාණ්ඩාගාර බිල්පත් (මාස 03)

**03. මුදල් ප්‍රවාහයන් ඃ-** මුදල් හා මුදල් හා සමාන දෑ ආයතනය තුළට ගලා ඒම ලැබීම් ප්‍රවාහයක් ලෙස ද ගලා යෑම් ගෙවීම් ප්‍රවාහයක් ලෙස ද හැඳින්වේ.

04. **මෙහෙයුම් ක්‍රියාකාරකම් :-** ව්‍යාපාර ආයතනයක ප්‍රධාන ආදායම් ඉපදවීමේ ක්‍රියාමාර්ග තුළින් ඇතිවන මුදල් ප්‍රවාහයන් **මෙහෙයුම් ක්‍රියාකාරකම් වේ.**

උදා :

- අත්පිට විකුණුම්
- වෙළෙඳ ලැබිය යුතු දෑ මත ලද මුදල්
- අත්පිට ගැනුම්
- වෙළෙඳ ගෙවිය යුතු දෑ සඳහා ගෙවූ මුදල්
- මුදලින් ගෙවූ පරිපාලන,බෙදාහැරීමේ හා අනෙකුත් මෙහෙයුම් වියදම්
- ගෙවූ පොලී
- ගෙවූ ආදායම් බදු

05. **ආයෝජන ක්‍රියාකාරකම් :-** අනාගත ආදායම් උත්පාදනය කිරීමේ අපේක්ෂාවෙන් වර්තමානයේ දී සම්පත් වෙනුවෙන් කෙරෙන මුදල් ප්‍රවාහයන් **ආයෝජන ක්‍රියාකාරකම් වේ.**

උදා :

- දේපල පිරියත හා උපකරණ මිලට ගැනීම වෙනුවෙන් කරන ගෙවීම්
- දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල්
- වෙනත් ව්‍යාපාරවල ස්කන්ධය හා ණය ප්‍රාග්ධනය අත්පත් කර ගැනීම වෙනුවෙන් කරන ගෙවීම්
- වෙනත් ව්‍යාපාරවල ස්කන්ධය හා ණය ප්‍රාග්ධනය විකිණීමෙන් ලද මුදල්
- ලැබූ පොලී
- ලැබූ ලාභාංශ
- ලැබූ කුලී
- සේවක ණය දීම්

06. **මූල්‍ය ක්‍රියාකාරකම් :-** ව්‍යාපාරයක ස්කන්ධයේ හා ණය ප්‍රාග්ධනයේ ප්‍රමාණයේ හෝ සංයුතියේ වෙනස්කම් ඇති කෙරෙන මුදල් ප්‍රවාහයන් **මූල්‍ය ක්‍රියාකාරකම් වේ.**

උදා :

- කොටස් නිකුත් කිරීමෙන් ලද මුදල්
- කොටස් නිදහස් කිරීමට ගෙවන මුදල්
- ණයකර හෝ වෙනත් දිගුකාලීන ණයගැනීම්වලින් ලද මුදල්

- ණයකර හෝ වෙනත් දිගුකාලීන ණය ආපසු ගෙවීම්
- ලාභාංශ ගෙවීම
- මූල්‍ය කල්බදු වාරික ගෙවීම් ( පොලී හැර)
- අයිතිකරුවන් වෙත කරන බෙදාහැරීම්

**ක්‍රියාකාරකම 01**

පහත සඳහන් අයිතමයන් LKAS 07 ප්‍රමිතයට අනුව අදාළ පරිදි හඳුනා ගන්න.අදාල අයිතමය ඉදිරියෙන් මුදල් හා මුදල් හා සමාන දෑ අයිතමයක් ද යන්න වාර්තා කරන්න.

| | |
|---|---|
| 01. සුළු මුදල් ශේෂය | ............................................................ |
| 02. මුදල් ශේෂය (වාසි දායක) | ............................................................ |
| 03. වසර 02 ක ආයෝජන | ............................................................ |
| 04. භාණ්ඩාගාර බිල්පත් (මාස 03 ට අඩු) | ............................................................ |
| 05. ස්ථාවර තැන්පතු (වර්ෂයක) | |

**ක්‍රියාකාරකම 02**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 (LKAS 07) ට අනුව ඍජු ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිලියෙල කිරීමේ දී පහත සඳහන් අයිතම වර්ගීකරණය කළ යුතු වන්නේ කුමන ක්‍රියාකාරකම ද යන්න දැක්වීමට තීරුවේ හරි ලකුණ යොදන්න.

| අයිතමය | මෙහෙයුම් | ආයෝජන | මූල්‍ය |
|---|---|---|---|
| 01. වෙළෙඳ ලැබිය යුතු දෑ වලින් ලැබෙන මුදල් හා චෙක්පත් | | | |
| 02. සේවක මණ්ඩලයට ගෙවූ වැටුප් හා වේතන | | | |
| 03. ආදායම් බදු ගෙවීම | | | |
| 04. ලාභාංශ ගෙවීම | | | |
| 05. ව්‍යාපාර ගොඩනගිල්ල සඳහා කුලී ලැබීම | | | |
| 06. කල්බදු ක්‍රමයට ගත් දේපළ සඳහා ගෙවූ වාරිකය (පොලී හැර) | | | |
| 07. රඳවාගත් ඉපයුම් ප්‍රාග්ධනිත කිරීම | | | |
| 08. ව්‍යාපාරයේ ප්‍රයෝජනයට යන්ත්‍රයක් මිලට ගැනීම | | | |

| | | | |
|---|---|---|---|
| 09. වෙළෙඳ ගෙවිය යුතු දැවලට ගෙවූ චෙක්පත් | | | |
| 10. පැරණි කාර්යාල උපකරණ විකිණීමෙන් ලද මුදල | | | |
| 11. ණය පොලී ගෙවීම | | | |
| 12. විගණන ගාස්තු ගෙවීම | | | |
| 13. ස්ථාවර තැන්පතු පොලී ලැබීම | | | |
| 14. බැංකු ණය ආපසු ගෙවීම | | | |
| 15. දේපල පිරියත හා උපකරණ මිල දී ගැනීම | | | |
| 16. පෞද්ගලික විදුලිය හා රක්ෂණ ගාස්තු ගෙවීම | | | |
| 17. දිගුකාලීන ආයෝජන අත්පත් කර ගැනීම | | | |
| 18. අත්පිට විකුණුම් | | | |
| 19. හිමිකම් කොටස් නිකුතුවෙන් ලද මුදල | | | |
| 20. බැංකු ණය ගැනීම | | | |
| 21. හිමිකම් කොටස් නිකුතුවෙන් ලද මුදල | | | |

## මුදල් ප්‍රවාහ වාර්තා කිරීම

**ව්‍යාපාරයක ගිණුම් කාලච්ඡේදයකට අදාළ මුදල ප්‍රවාහයන් වාර්තා කිරීමේ ක්‍රම**

01. ඍජු ක්‍රමය

02. වක්‍ර ක්‍රමය

මෙම ක්‍රම දෙකට ම ගණනය කළ හැකි වන්නේ ව්‍යාපාරයක මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහ පමණි.ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් ගණනය කළ හැකි වන්නේ ඍජු ක්‍රමයට පමණි. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් සකස් කර ඇත්තේ ඍජු ක්‍රමයට ද වක්‍ර ක්‍රමයට ද යන්න තීරණය වන්නේ මෙහෙයුම් ක්‍රියාකාරකම් ගණනය කිරීමේ දී අනුගමනය කරන ලද ක්‍රමය පදනම් කර ගැනීමෙනි.

**01. ඍජු ක්‍රමය**

ඍජු ක්‍රමයේ දී ආයතනයක දළ මුදල් ලැබීම් හා දළ මුදල් ගෙවීම් සියල්ල අනාවරණය කරයි.මෙහෙයුම් ක්‍රියාකාරකම් ඍජු ක්‍රමයට වාර්තා කිරීමේ දී ශුද්ධ ලාභය ගණනය කිරීමට යොදා ගන්නා ආදායම් හා වියදම් අයිතමයන්ගේ ජනනය වූ මුදල් ප්‍රවාහයන් අදාළ කර ගනියි.

**02. වක්‍ර ක්‍රමය**

වක්‍ර ක්‍රමයේ දී මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන් ගණනය කිරීමේ දී වර්ෂයේ ශුද්ධ ලාභයට හෝ ශුද්ධ ආදායමට මුදල් නොවන ගනුදෙනු කාරක ප්‍රාග්ධන අයිතමයන්ගේ වෙනස්වීම් සහ වෙනත් ක්‍රියාකාරකම්වලට අයත් එහෙත් ලාභය තුළ අඩංගු අයිතම වෙනුවෙන් ගැළපීම් කරනු ලබයි.මෙම ක්‍රමයට මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන් ගණනය කිරීමේ දී කාලච්ඡේදයේ බදු පෙර ශුද්ධ ලාභය ගෙන එහි අඩංගු මුදල්මය නොවන අයිතම ඉවත් කර ,කාරක ප්‍රාග්ධනයේ සංචලනයන් ගළපනු ලබයි.ඊට පසු මුදලින් ගෙවූ ආදායම් බදු හා ණය පොලී අඩු කර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන් ගණනය කරනු ලබයි.

## 01. ඍජු ක්‍රමය

.................. ව්‍යාපාරය

.......................... දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (රු.000)

| | | |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | |
| • අත්පිට විකුණුම් | | **xxx** |
| • වෙළෙඳ ලැබිය යුතු දෑ මත ලද මුදල් | | **xx** |
| • අත්පිට ගැනුම් | | **(xx)** |
| • වෙළෙඳ ගෙවිය යුතු දෑ සඳහා ගෙවූ මුදල් | | **(xx)** |
| • මුදලින් ගෙවූ පරිපාලන ,බෙදාහැරීමේ හා අනෙකුත් මෙහෙයුම් වියදම් | | **(xx)** |
| • මෙහෙයුම් කටයුතුවලින් ජනනය වු/යෙදවූ මුදල් | | **xx** |
| • ගෙවූ පොලී | | **(x)** |
| • ගෙවූ ආදායම් බදු | | **(x)** |
| • **මෙහෙයුම් කටයුතුවලින් ජනනය වු/යෙදවූ ශුද්ධ** | | **xx** |
| **ආයෝජන ක්‍රියාකාරකම්** | | |
| • දේපල පිරියත හා උපකරණ මිලට ගැනීම | **(x)** | |
| • දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල් | **xxx** | |
| • වෙනත් ව්‍යාපාරවල ස්කන්ධය හා ණය ප්‍රාග්ධනය අත්පත් කර ගැනීම වෙනුවෙන් කරන ගෙවීම් | **(x)** | |
| • වෙනත් ව්‍යාපාරවල ස්කන්ධය හා ණය ප්‍රාග්ධනය විකිණීමෙන් ලද මුදල් | **x** | |
| • ලැබූ පොලී /ලැබූ ලාභාංශ /ලැබූ කුලී | **x** | |
| • සේවක ණය දීම් | **x** | |
| • **ආයෝජන කටයුතුවලින් ජනනය වු/යෙදවූ ශුද්ධ මුදල්** | | **xx** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්** | | |
| • කොටස් නිකුත් කිරීමෙන් ලද මුදල් | **xx** | |
| • කොටස් නිදහස් කිරීමට ගෙවන මුදල් | **(x)** | |
| • ණයකර හෝ වෙනත් දිගුකාලීන ණයගැනීම්වලින් ලද මුදල් | **x** | |
| • ණයකර හෝ වෙනත් දිගුකාලීන ණය ආපසු ගෙවීම් | **(x)** | |
| • ලාභාංශ ගෙවීම | **(x)** | |
| • මූල්‍ය කල්බදු වාරික ගෙවීම් ( පොලී හැර) | **(x)** | |
| • අයිතිකරුවන් වෙත කරන බෙදාහැරීම් | **(x)** | |
| • **මූල්‍ය කටයුතුවලින් ජනනය වු/යෙදවූ ශුද්ධ මුදල්** | | **xx** |
| • ශුද්ධ මුදල් ජනනය වීම්/යෙදවීම | | **xx** |
| • ආරම්භක මුදල් හා මුදල් සමාන දෑ | | **xx** |
| • අවසාන මුදල් හා මුදල් සමාන දෑ | | **xxx** |

## 02.වක්‍ර ක්‍රමය

………………. ව්‍යාපාරය

……………………… දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (රු.000)

| | |
|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | |
| බදු පෙර ලාභය | xxx |
| • දේපළ පිරියත හා උපකරණ ක්ෂය | xx |
| • දේපළ පිරියත හා උපකරණ ඉවත් කිරීමේ ලාභ | (xx) |
| • දේපළ පිරියත හා උපකරණ ඉවත් කිරීමේ අලාභ | xx |
| • පොලී වියදම | x |
| • ලැබූ ලාභාංශ,කුලී,හා ලාභාංශ | (xx) |
| කාරක ප්‍රාග්ධන සංචලනයට පෙර මෙහෙයුම් ලාභය | xx |
| **කාරක ප්‍රාග්ධන සංචලනයන්** | |
| • තොග වෙනස් වීම (ආරම්භක හා අවසාන ශේෂ අතර වෙනස) | x |
| • වෙළෙඳ ලැබිය යුතු දැවල වෙනස් වීම (ආරම්භක හා අවසාන ශේෂ අතර වෙනස) | x |
| • වෙළෙඳ ගෙවිය යුතු දැවල වෙනස්වීම(ආරම්භක හා අවසාන ශේෂ අතර වෙනස) | x |
| • ඉදිරියට ගෙවූ වියදම් (ආරම්භක හා අවසාන ශේෂ අතර වෙනස) | x |
| • උපචිත වියදම් (ආරම්භක හා අවසාන ශේෂ අතර වෙනස) | x |
| මෙහෙයුම් කටයුතුවලින් ජනනය වු/යෙදවූ මුදල් | xx |
| • ගෙවූ පොලී | (x) |
| • ගෙවූ ආදායම් බදු | (x) |
| මෙහෙයුම් කටයුතුවලින් ජනනය වු/යෙදවූ ශුද්ධ මුදල් | xx |

**ක්‍රියාකාරකම 03**

සීමිත ජනුලි පොදු සමාගමේ 2019.03.31 දිනෙන් අවසන් වසර සඳහා සමාගම පිළියෙල කරන ලද මුදල් පාලන ගිණුම පහත දැක්වේ.

සීමිත ජනුලි පොදු සමාගමේ

2019.03.31 දිනෙන් අවසන් වසර සඳහා

මුදල් පාලන ගිණුම

| | (රු.000) | | (රු.000) |
|---|---|---|---|
| 2018.04.01 ඉ/ගෙ ශේෂය | 1500 | අත්පිට ගැනුම් | 2000 |
| අත්පිට විකුණුම් | 4000 | වෙළෙඳ ණයහිමියන්ට ගෙවීම් | 3500 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 7500 | පරිපාලන වියදම් | 2000 |
| ආයෝජන සඳහා ලාභාංශ ලැබීම් | 400 | බෙදාහැරීමේ වියදම් | 1200 |
| ගොඩනැගිලි කුලී ලැබීම් | 200 | ණය පොලී ගෙවීම | 1000 |
| ඉඩම් විකිණීමෙන් ලද මුදල | 5500 | ආදායම් බදු ගෙවීම | 2000 |
| සාමාන්‍ය කොටස් නිකුතුවෙන් ලැබීම් | 3000 | මෝටර් රථයක් මිලට ගැනීම | 4500 |
| බැංකු ණය ගැනීම | 2000 | ලී බඩු මිලට ගැනීම | 1500 |
| හිමිකම් නිකුතුවෙන් ලැබීම් | 1000 | ණය ආපසු ගෙවීම | 1000 |
| | | කල් බදු වාරිකය ගෙවීම | 2800 |
| | | ගෙවූ ලාභාංශ | 2400 |
| | | 2019.03.31 ප/ගෙ ශේෂය | 1200 |
| | 25100 | | 25100 |
| 2019.04.01 ඉ/ගෙ ශේෂය | 1200 | | |

සටහන් : ගෙවූ කල්බදු වාරිකය තුල රු.500 ක කල්බදු පොලී ද ඇතුළත්ව ඇත.

අවශ්‍ය වන්නේ :

01. මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල ඍජු ක්‍රමයට දැක්වෙන ආකාරයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කරන්න.

**ක්‍රියාකාරකම 04**

සීමිත සචිත්ත පොදු සමාගමේ සාරාංශ මූල්‍ය ප්‍රකාශන පහත පරිදි වේ.

සීමිත සචිත්ත පොදු සමාගම

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ලාභාලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (රු.000)

| | | |
|---|---|---|
| විකුණුම් | | 8000 |
| විකුණුම් පිරිවැය | | (4800) |
| දළ ලාභය | | 3200 |
| වෙනත් ආදායම් - මෝටර් රථ විකිණීමේ ලාභය | | 200 |
| | | 3400 |
| බෙදාහැරීමේ වියදම් | 800 | |
| පරිපාලන වියදම් | 1000 | |
| මූල්‍ය වියදම් - ණයපොලී | 100 | (1900) |
| බදු පෙර ලාභය | | 1500 |
| ආදායම් බදු | | (450) |
| කාලච්ඡේදය සඳහා ලාභය | | 1050 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | |
| ඉඩම් ප්‍රත්‍යාගණන ලාභය | 1200 | 1200 |
| මුළු විස්තීර්ණ ආදායම | | 2250 |

සීමිත සචිත්ත පොදු සමාගම

2019.03.31 දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | 2019 (රු.000) | 2018 (රු.000) |
|---|---|---|
| ඉඩම් | 8500 | 6000 |
| ගොඩනැගිලි - ධාරණ අගය | 10800 | 9000 |
| මෝටර් රථ - ධාරණ අගය | - | 5000 |
| තොගය | 1800 | 1600 |
| වෙළෙඳ ණයගැතියෝ | 600 | 700 |
| ත්‍රෛමාසික භාණ්ඩාගාරික බිල්පත් | 200 | 100 |
| බැංකුවේ ඇති මුදල් | 900 | 1200 |
| මුළු වත්කම් | 22800 | 22800 |

| | | |
|---|---|---|
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 14000 | 12000 |
| සංචිත - ප්‍රත්‍යගණන සංචිතය | 1200 | - |
| රඳවාගත් ඉපැයුම් | 3150 | 4800 |
| බැංකු ණය | 3350 | 4700 |
| වෙළෙඳ ණයහිමියෝ | 700 | 1600 |
| ගෙවිය යුතු ආදායම් බදු | 160 | 300 |
| ගෙවිය යුතු පොලී | 40 | 50 |
| උපචිත වැටුප් | 200 | 150 |
| මුළු හිමිකම් හා වගකීම් | 22800 | 22800 |

අතිරේක තොරතුරු :-

01. සියළු විකුණුම් ණය පදනම මත සිදුවන අතර ගැනුම්වලින් 60% ක් ණය පදනම මත හා 40% ක් අත්පිට මුදලට සිදුවේ.

02. වර්ෂය තුළ රු.2000000 ක් දරමින් ගොඩනැගිලි නවීකරණය කළ අතර එමඟින් ගොඩනැගිලි වල ඵලදායී ජීව කාලය වැඩි විය.

03. 2019.03.31 දිනට ධාරණ අගය රු.4500000 ක් වූ සමාගම සතු මෝටර් රථය අතිපිට මුදලට විකුණන ලදී.

04. වර්ෂය තුළ කොටස් නිකුත් කිරීමක් සිදු නොවූ අතර රඳවාගත් ඉපැයුම් භාවිතා කොට සංචිත ප්‍රාග්ධනීකරණයක් සිදු කර ඇත.

05. වර්ෂය තුළ නව ඉඩමක් මිල දී ගත් අතර 2019.03.31 දින සමාගම සතු සියළු ඉඩම් ප්‍රත්‍යාගණනය කරන ලදී.

06. වර්ෂය තුළ දී අතුරු ලාභාංශ ගෙවා ඇත.

අවශ්‍ය වන්නේ :-

01. මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල ඍජු ක්‍රමයට දැක්වෙන ආකාරයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කරන්න.

**ක්‍රියාකාරකම 05**

සීමිත මෙත්ලිනි පොදු සමාගමේ තොරතුරු පහත දැක්වේ. (රු.)

| | |
|---|---|
| 2018.04.01 දිනට රඳවා ගත් ඉපයුම් ගිණුමේ ශේෂය | 4000 |
| 2019.03.31 න් අවසන් වසර තුල සිදු වූ ගනුදෙනු සමහරක් | |
| සාමාන්‍ය කොටස් හිමියන්ට ගෙවූ ලාභාංශ | 500 |
| සාමාන්‍ය කොටස් හිමියන්ට යෝජිත ලාභාංශ | 400 |
| හිමිකම් කොටස් නිකුතුවෙන් ලද මුදල් | 2000 |
| රඳවා ගත් ඉපයුම් ප්‍රාග්ධනිත කිරීම | 1000 |
| පොදු සංචිතයට මාරු කිරීම | 1500 |
| වසර තුළ මුදලින් ගෙවූ බදු | 1200 |
| වසරට අදාළ බදු වියදම | 600 |
| 2019.03.31 දිනට රඳවා ගත් ඉපයුම් ගිණුමේ ශේෂය | 5400 |

අවශ්‍ය වන්නේ :-

සීමිත මෙත්ලිනි පොදු සමාගමේ බදු පෙර ලාභය ගණනය කරන්න.

**ක්‍රියාකාරකම 06**

LKAS – 07 අනුව වක්‍ර ක්‍රමයට මෙහෙයුම් ක්‍රියාකාරකම් ගණනය කිරීමේ දී බදු පෙර ලාභය දී ඇති විටක පහත සඳහන් අයිතම සම්බන්ධයෙන් කළ යුතු ගැළපීම් අදාළ පරිදි සටහන් කරන්න.

| අයිතමය | කළ යුතු ගැළපීම | | |
|---|---|---|---|
| | එකතු කළ යුතුයි | අඩු කළ යුතුයි | ගැලපීම අවශ්‍ය නැත |
| දේපළ පිරියතහා උපකරණ මත ක්ෂය වීම | | | |
| ලැබූ ලාභාංශ ආදායම | | | |
| මෝටර් රථ විකිණීමෙන් ලද ලාභය | | | |
| පොලී වියදම | | | |
| ණයගැතියන්ගෙන් ලද මුදල | | | |
| මුදලින් ගෙවූ බදු | | | |

වසරට අදාළ බදු වියදම

මුදලින් ගෙවූ පොලිය

**ක්‍රියාකාරකම 07**

සීමිත සංකල්ප සමාගමේ 2019.03.31 හා 2018.03.31 දිනට ජංගම වත්කම් හා ජංගම වගකීම් පහත දැක්වේ. LKAS – 07 අනුව වක්‍ර ක්‍රමයට මෙහෙයුම් ක්‍රියාකාරකම් ගණනය කිරීමේ දී කාරක ප්‍රාග්ධන සංචලනයන්ගේ වෙනස්වීම් සටහන් කළ යුතුය.ඒවායේ වෙනස්වීම් එකතු කරන්නේ නම් ( ) ලෙස ද අඩු කරන්නේ නම් (-) ලෙස ද දක්වන්න. (රු.000)

| අයිතමය | 2018.03.31 | 2019.03.31 | කළ යුතු ගැලපීම |
|---|---|---|---|
| අවසන් තොගය | 2000 | 2500 | |
| ඉදිරියට ගෙවූ වියදම් | 500 | 300 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 3500 | 1000 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 1200 | 1700 | |
| උපචිත මෙහෙයුම් වියදම් | 700 | 300 | |

**ක්‍රියාකාරකම 08**

සීමිත පැහැසර පොදු සමාගමේ මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල සාරාංශගත තොරතුරු පහත පරිදි වේ.

| | 2019.03.31 | 2018.03.31 |
|---|---|---|
| | (රු.000) | ( රු.000) |
| ඉඩම් | 1600 | 1000 |
| ගොඩනැගිලි පිරිවැයට | 3000 | 3000 |
| සමුච්චිත ක්ෂය - ගොඩනැගිලි | (900) | (800) |
| මෝටර් රථ - පිරිවැයට | 3500 | 6000 |
| සමුච්චිත ක්ෂය - මෝටර් රථ | (2100) | (2400) |
| ආයෝජන | 300 | - |
| තොගය | 700 | 600 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 900 | 1300 |
| බැංකුවේ ඇති මුදල් | 600 | 400 |
| මුළු වත්කම් | 7600 | 9100 |

| | | |
|---|---|---|
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 4700 | 4500 |
| පොදු සංචිතය | 1200 | 1000 |
| රඳවාගත් ඉපයුම් | 1000 | 800 |
| වෙළෙඳ ණයහිමියෝ | 400 | 1600 |
| උපචිත වියදම් | 200 | 900 |
| ගෙවිය යුතු ආදායම් බදු | 100 | 300 |
| මුළු හිමිකම් හා වගකීම් | 7600 | 9100 |

අතිරේක තොරතුරු :

01. 2019.03.31 න් අවසන් වසර සඳහා ආදායම් ප්‍රකාශනයේ පහත තොරතුරු ඇතුළත් ය.

| | (රු000) |
|---|---|
| බදු පෙර ලාභය | 1100 |
| (-) ආදායම් බදු | (300) |
| වර්ෂයේ ලාභය | 800 |

02. වර්ෂය තුළදී නව ඉඩමක් මිලදී ගෙන ඇත.එමෙන්ම විකුණන දිනට ධාරණ අගය රු.1500000 ක් වු මෝටර් රථයක් වර්ෂය තුළ රු.1700000 කට අත්පිට මුදලට විකුණන ලදී. අලුතින් මෝටර් රථයක් මිලදී ගෙන නොමැත.

03. සමාගම වර්ෂය තුළ දිගුකාලීන ආයෝජන මිලදී ගෙන ඇත.

04. සමාගම විසින් වර්ෂය තුළ කොටස් නිකුතුවක් සිදු කළ අතර එහි වටිනාකම රු.200000 කි.

05. වර්ෂයේ ලාභයෙන් රු.200000 ක් පොදු සංචිතයට මාරු කර ඇත.

06. වර්ෂය තුළදී රු.400000 ක අතුරු ලාභාංශ සාමාන්‍ය කොටස් හිමියන්ට ගෙවා ඇත.

07. ගිණුම් වර්ෂය තුළ මුදලින් ලද ආයෝජන ආදායම රු.50000 කි.

අවශ්‍ය වන්නේ :-

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව 2019.03.31 න් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (වක්‍ර ක්‍රමයට)

**ක්‍රියාකාරකම 09**

සීමිත වෙහාන් සමාගම

2019.03.31 දිනෙන් අවසන් වසර සඳහා

ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

(රු.000)

| | | |
|---|---|---|
| විකුණුම් | | 9500 |
| විකුණුම් පිරිවැය | | (4500) |
| දළ ලාභය | | 5000 |
| වෙනත් ආදායම් | | 500 |
| | | 5500 |
| බෙදාහැරීමේ වියදම් | 1400 | |
| පරිපාලන වියදම් | 1600 | |
| මූල්‍ය වියදම් | 400 | (3400) |
| බදු පෙර ලාභය | | 2100 |
| වර්ෂයේ ආදායම් බදු | | (600) |
| කාලච්ඡේදයේ ලාභය | | 1500 |

සීමිත වෙහාන් සමාගම

2019.03.31 දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | (රු.000) |
|---|---|
| දේපළ පිරියත හා උපකරණ | 7000 |
| ආයෝජන (සීමිත ශාන්ති සමාගම) | 2000 |
| තොගය | 1500 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 4000 |
| බැංකුවේ ඇති මුදල් | 1000 |
| මුළු වත්කම් | 15500 |
| **හිමිකම් හා වගකීම්** | |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය(රු. කොටස් 100) | 9000 |
| රඳවා ගත් ඉපයුම් | 1000 |
| 10% බැංකු ණය (2018.04.01) | 3000 |

| | |
|---|---|
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 2250 |
| ගෙවිය යුතු පොලී | 150 |
| ගෙවිය යුතු බදු | 100 |
| මුළු හිමිකම් හා වගකීම් | 15500 |

අතිරේක තොරතුරු :-

01. සීමිත වෙහාන් සමාගම සියලු ගැනුම් හා විකුණුම් ණය පදනම මත සිදු කර ඇත.මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන වෙළෙඳ ලැබිය යුතු දෑ වෙළෙඳ ණයගැතියන් වන අතර වෙළෙඳ  ගෙවිය යුතු දෑ වෙළෙඳ ණය හිමියන් වේ.

02. ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන මූල්‍ය වියදම්යලින් රු.100000 ක් බැංකු ගාස්තු වන අතර ඉතිරිය බැංකු ණය සඳහා පොලිය වේ.

03. දේපළ පිරියත හා උපකරණ සංයුතිය පහත දැක්වේ.

| වත්කම | පිරිවැය | සමුච්චිත ක්ෂය | ධාරණ අගය |
|---|---|---|---|
| යන්ත්‍ර හා උපකරණ | 2400 | 400 | 2000 |
| මෝටර් රථ | 3000 | 600 | 2400 |
| ඉඩම | 2600 | - | 2600 |
| | 8000 | 1000 | 7000 |

සියලු දේපළ පිරියත හා උපකරණ අත්පිට මුදලට ගෙන ඇත.

04. වෙනත් ආදායම් ලෙස දක්වන්නේ ආයෝජන සඳහා ලද ලාභාංශ වේ.

05. සමාගම වසර තුළ දී ලාභංශ ගෙවා ඇත.

අවශ්‍ය වන්නේ :

01. LKAS -7 අනුව

- මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ/යෙදවූ මුදල ඍජු ක්‍රමයට දැක්වෙන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ/යෙදවූ මුදල වක්‍ර ක්‍රමයට දැක්වෙන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශනය